# වර්ග සංහාරයඃ 'ඔළුවට' එරෙහිව හදවතින් සටන් කිරීම

යූජීන් ඉයනෙස්කෝගේ 'රයිනෝසිරස්' නාට්‍යයේ පළමු රංගය දිගහැරෙන්නේ මෙසේ යඃ පසුබිම නගර චතුරශ්‍රයකි. එහි රැඳීගත් නුවරුන් සාමීචියෙහි යෙදේ. බීමතට ලොල් වූ බෙරාන්ෂේද ඔහුගේ මිත්‍ර ෂෝන් ද ඒ අතර වෙති. මනුෂ්‍ය අධිෂ්ඨාන බලය ගැන හා තර්ක න්‍යාය ගැන ගැඹුරු වාද විවාදවල ගිළුණු චතුරශ්‍රය මැදින් හිටිහැටියේ රයිනෝසිරසයෙකු දිව යයි. අනපේක්ෂිත දසුනින් කැළඹෙන පිරිස් මොහොතකට සාමීචිය නවතා විශ්මයෙන් මුමුණති. අනතුරුව එය අමතක කොට යළිත් සල්ලාපයේ ගැළෙති. කාලය ගෙවී යයි. ඒ අතරවාරයේ තවත් රයිනෝසිරසයෙකු චතුරශ්‍රය හරහා දිව යයි. එතැන් සිට, වික්ෂිප්ත නගර වැසියන්ගේ සාකච්ඡාවන්ගේ තේමාව බවට රයිනෝසිරස්ලා පත් වේ. වහාම රයිනනෝලා නවතාලිය යුතු බවට සියල්ලෝ ගිවිස ගනිති. නමුත් අනතුරුව දවසින් දවස නගර වැසියන් එකා බැගින් රයිනෝලා බවට පෙරළෙන ආකාරය දෙස බෙරාන්ෂේද, ප්‍රේක්ෂකයෝද බලා සිටිති. අවසානයේ බෙරාන්ෂේ හා ප්‍රේක්ෂකයින් හැරුණු විට සෙසු සියල්ලෝ රයිනෝසිරස්ලා බවට හැරෙති.

ප්‍රංශ-රුමේනියානු නාට්‍යකරු ඉයනෙස්කෝ, පසු කලෙක 'රයිනෝසිරස්' නාටකයේ පසුබිම් සන්දර්භය මෙසේ පහදයිඃ ''මා, රුමේනියාවේ තරුණයෙකුව සිටි වකවානුව කරා අපි ආපසු යා යුතු වෙමු. මා වටා සිටියවුන් මුළුමණින්ම ෆැසිස්ට්වාදය වෙතට හැරෙන ආකාරය දැකීමෙන් මම විශ්මයට පත් වීමි. එය එක රැයකින් සිදු නොවූ බව ඇත්තකි. එය ක්‍රමානුකූල ක්‍රියාදාමයකි. ටිකෙන් ටික, - වෘත්තීයවේදීන්, බුද්ධිමතුන්, ඊනියා ලිබරල්වාදීන් - යන සියල්ලෝ බලයේ ඇති පක්ෂය හා සම්බන්ධ වීමට ප්‍රමාණවත් හේතු කෙසේ හෝ සොයාගත්හ. ඔබට අහම්බෙන් ඔබේ පරණ මිතුරෙකු හමුවුණා යැයි සිතන්න - හිටිහැටියේ ඔබේ ඇස් පනාපිට ඔහු වෙනස් වන්නට පටන් ගනියි. ඔබට තව දුරටත් ඔහු සමග බුද්ධිමත් ආකාරයෙන් කතා කිරීමට නොහැකි අතර ඔහු තව දුරටත් සබුද්ධික මනුෂ්‍යයෙකු ලෙස නොහැසිරේ....රුමේනියාවේ සිටින අතරවාරයේ මා තැබූ දින සටහන්වලින් මා කියා සිටියේ මා වටා සිටි සියල්ලන් එකා බැගින් ක්‍රමානුකූලව මෘගයින් නොහොත් රයිනෝසිරස්ලා බවට පෙරළුණු ආකාරය ගැනයි.'' *(Ionesco's Imperatives: the politics of culture - Rosette C. Lamont / 137-138 පිටු)*

දකුණු ලංකාවේ වීදි ඔස්සේ දස වසරකට පෙර රයිනෝවෙකු හෝ දෙන්නෙකු අහම්බෙන් දිව ගියහ. ඒ දැක ඇතැම්හු පළමුව උත්ප්‍රාසය හා මවිතය පළ කළහ. දෙවනුව අමතක කොට දැමූහ. දස වසරක් ගෙවුණු තැන දැන් කතාව වෙනස් ය. රයිනෝලා ගහණ ලංකාවේ, අතරින් පතර හුදකලා වූ බෙරාන්ෂේලා වන් මනුෂ්‍යයින් ගැවසෙයි. මේ දවස්වල මා ලියන්නේ ඒ මනුෂ්‍යයින් වෙනුවෙනි.

**වර්ග සංහාරය ගැන මා කීවේ කුමක්ද?**

අප්‍රේල් 05 වෙනිදා 'රාවය' පත්‍රයට වික්ටර් අයිවන් 'ජන සංහාරය' ගැන ලිපියක් ලියා තිබිණ. 'දෙමළ සංහාරය ඇත්තක්ද?'යි ඔහු විමසා තිබේ. බැලූ බැල්මට නැති හැඩකි. නමුත් 'වර්ග සංහාරය' ගැන මා විසින් පටලවාගත් සංවාදයට එහි අදාළත්වයක් තිබේ. ඒ නිසා ඊට පිළිතුරු බඳින්නට මට සිදු වේ. කොහොමටත් මා 'සමාජ ප්‍රජාතන්ත්‍රවාදියෙකු' නොවන නිසා මට ඊට කාලය සොයාගත හැකි ය.

මා කීවේ කුමක්ද?

යුද්ධයකදී මුදුන්පත් කරගැනීමට අපේක්ෂිත යුදමය අරමුණු මෙන්ම දේශපාලන අභිලාෂයන්ද තිබේ. සමස්ත යුද සැළසුම් සකස් වන්නේ අපේක්ෂිත දේශපාලන අභිප්‍රායයන් සාක්ෂාත් කරගැනීමට පිටුබල සපයන පරිද්දෙනි. දැන් ඇවිළ යන යුද්ධයේ අරමුණු සහ අභිලාෂයන් මනෝමය වශයෙන් පරිකල්පනය කරන්නට මට උවමනාවක් නැත. මන්ද යත්, යුද්ධය මෙහෙයවනු ලබන සේනාධිපතියන් ඒවා කවරේදැයි දැනටමත් සහසුද්දෙන්ම කියා ඇති හෙයිනි. මා කළේ ඒවා එකින් එක මූලාශ්‍ර පෙන්වමින් උපුටා දැක්වීම ය. ඒවායේ අවසාන දේශපාලන ඓක්‍යය මේ යැයි පෙන්වාදීම ය. 'මේ රට පාලනය කළයුත්තේ 74%ක් වූ බහුතර ජාතිය විසිනැ'යි ඉකුත් අවුරුද්දේ ජූලි 18 වෙනිදා 'ඩේලි නිවුස්' පත්‍රයට කීවේ මා නොවේ. 'මේ රට අයිති සිංහලයින්ට බවත්, සුළුතර ජාතීන් තමන්ට නොගැළපෙන ඉල්ලීම් නොකළ යුතු බවත්' ඒ අවුරුද්දේම සැප්තැම්බර් 23 වෙනිදා කැනඩාවේ 'නැෂනල් පෝස්ට්' පත්‍රයට කීවේ ද මා නොවේ. ඒ ප්‍රකාශයන් කරන ලද්දේ දැන් දියත්ව ඇති සමස්ත හමුදා ක්‍රියාන්විතයන්ට මුදුනින්ම අණ දෙන්නා විසිනි. 'මුලතිවු'හි කොටු වී සිටින ජනයා සිවිල් වැසියන් සේ නොසැළකිය යුතු යැයිද, ඔවුහු කොටි සංවිධානයේ මහාවිරු පවුල් සාමාජිකයින් බවද' ජනවාරි 28 වෙනිදා කල්පනා වූයේ මට නොවේ. එය කල්පනා වූයේ ආණ්ඩුවේ ප්‍රධාන පාර්ශ්වකාර ජාතික හෙළ උරුමයේ නායක කාරකාදීන්ට ය. 'තව දුරටත් රජයේ පාලන ප්‍රදේශවලට නොපැමිණෙන ජනයාගේ ආරක්ෂාව පිළිබඳ වගකීම රජයේ හමුදාවන්ට සහතික කළ නොහැකි'යැයි මා උපුටා ගත්තේ කොටි සංවිධානයේ ප්‍රචාරක පත්‍රිකාවකින් නොවේ. ජාතික ආරක්ෂාව පිළිබඳ රජයේ මාධ්‍ය මධ්‍යස්ථානය විසින් පෙබරවාරි 03 වෙනිදා නිකුත් කළ නිවේදනයකිනි. මේවා යුද්ධයේ වර්ග නාශක අභිලාෂයන් පිළිබඳ පැහැදිලි හැඟවුම් නොවන්නේද?

ඒ ප්‍රකාශිත අදහස් ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවීමේ ප්‍රතිවිපාක පිළිබඳ සංයුක්ත සාක්ෂි මගේ ලිපියෙහි අඩංගු වේ. පළමුව ප්‍රකාශිත දේශපාලන ආස්ථානයන්, යුදමය ක්‍රියාමාර්ග බවට පරිවර්ථනය වූ විට ලැබෙන තාර්කික ප්‍රතිඵල එමගින් විවරණය වේ. ''*එල්ටීටීඊයට එරෙහිව පවත්වාගෙන යන යුද ව්‍යාපාරය දෙමළ ජනතාව කෙරෙහි අති විශාල පීඩාවක් ඇති කිරීමට හේතු වී තිබෙන බව සත්‍යයකි. එහෙත් එය දෙමළ සංහාරයක් අරමුණු කොටගෙන ක්‍රියාත්මක වන ව්‍යාපාරයක් සේ විග්‍රහ කළ හැක්කේ කෙසේද?*'' - වික්ටර් අයිවන් අසයි. මගේ ප්‍රශ්නය මෙයයි. 'මේ රට අයිති සිංහලයින්ට යැයිද, මේ රට පාලනය කළ යුත්තේ ඔවුන් විසින් යැයිද, සුළු ජාතීන් තම තරමට අයිතීන් ඉල්ලිය යුතු යැයිද' පළමුව ප්‍රකාශ කොට, අනතුරුව ජනවාරි 20 වෙනිදා සිට මාර්තු මාසයේ 07 වෙනිදා දක්වා දින 47ක කාලය තුළ 2,600කට වැඩි දෙමළ ජනතාවක් ඝාතනය කර, 7,200කට වැඩි පිරිසක් තුවාල සිදු කොට ඇතිනම් 'එය දෙමළ සංහාරයක් අරමුණු කොටගෙන ක්‍රියාත්මක වන ව්‍යාපාරයක් සේ විග්‍රහ කළ නොහැක්කේ කෙසේද?'' - ඒ ගණන් මිණුම් මා උපුටා ගන්නේ කොටි සංවිධානයේ ප්‍රචාරක වෙබ් අඩවියකින් නොවේ. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්වරිය විසින් මාර්තුවේදී උපුටා දක්වන ලද *Civilian Casualities in the Vanni -Overview / United Nations Office of the Resident Coordinator and Humanitarian Coordinator /*

*March 2009* ලියැවිල්ල කියවා බැලීම ඊට ප්‍රමාණවත් ය.

වර්ග සංහාරය ගැන නීතිමය අර්ථ නිරූපණය ලංකාවට ගැළප්පීම මගේ සිතු මනාපය අනුව කළ හැක්කක් නොවේ. නමුත් අවාසනාවට ඉන් ගැලවී යාම වික්ටර් අයිවන්ගේ සිතු මනාපය අනුවද කළ හැකි නොවේ. ඊට හේතුවක් තිබේ. ජාත්‍යන්තර නෛතික රාමුව තුළ වර්ග සංහාරයන් පිළිබඳ මූලික අර්ථ නිරූපණයන් සකස් වූයේ ශ්‍රී ලංකාවේ යුද්ධය ඇවිළ යාමට අඩුම වශයෙන් තිස් පස් අවුරුද්දකට කලිනි. ඊට අදාළ මූලික නෛතික පදනම් නිර්මාණය කරන ලද්දේ පෝලන්ත නීතිවේදියෙකු වූ රෆායෙල් ලෙම්කින් විසිනි. ඔහු හිට්ලර්ගේ සංහාරයෙන් ගැළවුණු යුදෙව්වෙකි. වර්ග සංහාරයක මූලික අරුත් පහදමින් 1944දී ඔහු මෙසේ ලීවේය: වර්ග සංහාරයක් යනු ''කිසියම් ජාතික ප්‍රජාවක් සහමුලින්ම අතුගා දැමීමේ අරමුණ සහිතව, ඔවුන්ගේ ජාතික ජීවිතයේ අත්‍යවශ්‍ය පදනම් විනාශ කිරීම ඉලක්ක කළ විවිධ ක්‍රියාමාර්ග ගණනාවක් සම්බන්ධීකරණය කරන්නා වූ සැළැස්මකි.'' *(Axis of Rule in Occupied Europe: Laws of Occupation, Anlysis of Geovernment, Proposals for Redress - Raphael Lemkin / 79* පිටුව) 1948දී එක්සත් ජාතීන් විසින් කෙටුම්පත් කළ වර්ග සංහාරයන් වළකාලීමේ සහ දඬුවම් පැමිණවීමේ ප්‍රඥප්තිය මගින් මූලික වශයෙන් සිදුකරන ලද්දේ ලෙම්කින්ගේ අර්ථ නිරූපණය වඩා පුළුල් කොට එය ජාත්‍යන්තර නීතියක් බවට පෙරළීමයි. ලෙම්කින් විසින් යෙදූ 'ජාතික ප්‍රජාවක් මුළුමණින්ම විනාශ කිරීම' යන්න වෙනුවට 'ජාතික, ජනවාර්ගික හෝ ආගමික ප්‍රජාවක් පූර්ණ හා අර්ධ වශයෙන් විනාශ කිරීම' වර්ග සංහාරයකැයි අර්ථ කථනය කරන ලද්දේ ඒ මගිනි. ශ්‍රී ලංකාවේ දෙමළ ජනයාගේ ජාතික ජීවිතයේ අත්‍යවශ්‍ය පදනම් විනාශ කිරීම ඉලක්ක කොටගෙන' මෙරට පාලක පන්ති බල හවුල් විසින් දියත් කරන ලද 'සැළැස්මක්' තිබුණේ දැයි කුකුසක් ඇති නම් වික්ටර් අයිවන් විසින් කලෙකදී ලියන ලද 'දෙමළ අභියෝගය' කෘතිය දැන් කියවා බැලීම අයිවන්ටම වැදගත් විය හැක. දැන් දිග හැරෙන්නේ ඒ කෘතියේ ඊ ළඟ පරිච්ඡේදයන්ට ඇතුළත් විය යුතු ඒ සැළැස්මේ ඉතිරි අඩයි.

**ජන සංහාරය සහ වර්ග සංහාරය**

ජනතා විමුක්ති පෙරමුණ විසින් '87-89 වකවානුවේ මෙහෙයවන ලද සන්නද්ධ නැගිටීම හා දෙමළ ජනයාගේ දිග්ගැසුණු සන්නද්ධ අරගලය ගැන අයිවන්ගේ ප්‍රියතම සංසන්දනය විමසා බැලිය යුත්තේ ඉහත පසුබිම තුළ ය. ජවිපෙ නැගිටීම් විසින් අරමුණු කරන ලද්දේ රාජ්‍ය බලය සහමුලින් අත්පත් කරගැනීම ය. ඒ නැගිටීම් පුපුරා ගියේ ජනවාර්ගික විභේදන රේඛා ඔස්සේ නොවේ. කැරලිකරුවන්ගේද, පාලක බල හවුලේද, සන්නද්ධ හමුදා සෙබළුන්ගේද අති මහත් බහුතරය නියෝජනය වූයේ සිංහලයින්ගෙනි. ජවිපෙ නැගිටීම තලා දැමීමේ රාජ්‍ය පිළිවෙත වර්ග සංහාරක *(genocide)* පිළිවෙතක් නොවන්නේ එහෙයිනි. එය ජන සංහාරය කි *(mass killings or massacre).* ජාතික සමානත්වය හා වෙන්ව ජීවත්වීමේ අයිතිය ඉල්ලූ දෙමළ ජනයාගේ අවිගත් නැගිටීම පුපුරා ගියේ මූලික වශයෙන්ම වාර්ගික විභේදන රේඛා ඔස්සේ ය. එය මර්දනය කරනු වස් මුල් වූ සෑම බල හවුලක් මෙන්ම සන්නද්ධ හමුදාවන්ද සිංහලයින්ගෙන් සැදුම්ලත් අතර සන්නද්ධ කැරලිකරුවන්ගේ සියයට සීයක්ම දෙමළ ජනවාර්ගික පදනම් නියෝජනය කළේය. කොටින්ම මුලින් කී ජන සංහාරයට ගොදුරු දිවි ගළවාගත් ජවිපෙ කැරලිකරුවන් පවා අළුත් වටයකින් දෙමළ සන්නද්ධ අරගලයට එරෙහිව රාජ්‍ය අභිලාෂයට ගැට ගසන ලද්දේ මේ සිංහලකමේ ජනවාර්ගික රැහැනෙනි. මේ දක්වා සිංහල ජනයා සිංහල වීම හේතුවෙන් වෙනස් ලෙස සැළකීමේ හෝ මර්දනයට ලක්වීමේ රාජ්‍ය පිළිවෙතක ගොදුරක් වී නැත. නමුත් දෙමළ ජනයා දෙමළ වීම හේතුවෙන් වෙනස් ලෙස සැළකීමේ හා මර්දනයට ලක්වීමේ රාජ්‍ය පිළිවෙතක ගොදුරක් බවට පත්වූයේ දෙමළ ජනයා අතරින් සන්නද්ධ ව්‍යාපාරයන් මතුව ඒමට බොහෝ කලිනි. අයිවන්ගේ සංසන්දනයන් දෙපයින් සිටගැනීමට අපොහොසත් වන්නේ එහෙයිනි.

අපි නිදසුනක් සළකා බලමු. පශ්චාත් යුද කාලීන ලෝකයේ පාලන බලයෙන් බැහැරව සිටි විශාලතම කොමියුනිස්ට් පක්ෂය ක්‍රියාත්මක වූයේ ඉන්දුනීසියාවේ ය. 1965 ඔක්තෝබරයේදී රාජ්‍ය බලය පැහැරගත් ජෙනරාල් සුහර්තෝ ඉක්බිති එළඹි දැවුරුද්ද තුළ කොමියුනිස්ට් පක්ෂ සාමාජිකයින් හා අනුගාමිකයින් ඇතුළු ඉන්දුනීසියානුවන් පන් ලක්ෂයක් දෙනා සමූල සංහාරය කරන ලදී. සුහර්තෝගේ හමුදා නැගෙනහිර ටිමෝරයේ වාඩි ලා ගත්තේ එයින් දස වසරකට පසු 1975 දෙසැම්බරයේදී ය. එතැන් සිට එළඹි විසි හත් අවුරුද්දක් ඇතුළත සුහර්තෝගේ හමුදාවෝ ලක්ෂයකට වැඩි ටිමෝර ජාතික ජනයා සංහාරය කළහ. සංසන්දනාත්මකව බලතොත් සුහර්තෝගේ හමුදාවන් විසින් දැවුරුද්දක් ඇතුළත ඝාතනය කරන ලද ඉන්දුනීසියානු ජන සංඛ්‍යාව, විසි හත් අවුරුද්දක් ඇතුළතදී නැගෙනහිර ටිමෝරය තුළ දී ඉන්දුනීසියානු හමුදා විසින් ඝාතනය කරන ලද සංඛ්‍යාව මෙන් පස් ගුණයකට ආසන්න වේ. නමුත් නැගෙනහිර ටිමෝරය තුළ ඉන්දුනීසියානු පිළිවෙත වර්ග සංහාරක එකකැයි වටහා ගැනීමට ඒ මළ මිනී පිළිබඳ ගණන් මිණුම් බාධා නොකරයි. එකක් ජන සංහාරයකි. අනෙක වර්ග සංහාරයකි. දෘෂ්‍යමානයේ සමානකම හරයාත්මක සමානකම්වලට මග නොපාදයි. වෙනස එයයි.

දෙමළ ජනයා සම්බන්ධයෙන් රාජ්‍ය පිළිවෙත වර්ග සංහාරක එකකැයි ඔප්පු කරන්නට මුළුමහත් ලංකාවාසී දෙමළ ජනයා පුදුකුඩියිරුප්පුවේ ජීවත් විය යුතු නොවේ. එමෙන්ම ඒ සියළු ජනයා සමූල ඝාතනය කළ යුතු ද නොවේ. එවැනි කල්පනාවන් පහළ වන්නේ වර්ග සංහාරය පිළිබඳ පිළිගත් මූලික නීතිමය අර්ථ නිරූපණය පිළිබඳ දුරවබෝධයෙනි. ගාසා තීරයේදී පලස්තීන ජන වර්ග සංහාරයක නිරත වන මුත් ඊශ්‍රායෙලයේ ජනගහණයෙන් 20%ක් අරාබි ජාතිකයෝ වෙති. ඔවුහු ජනවාර්ගිකව පලස්තීනුවන් වශයෙන් පිළිගැණෙන අතර පුරවැසිභාවයෙන් ඊශ්‍රායෙල්වරුන් සේ සැළකේ. ඊශ්‍රායෙල් මධ්‍යම ජන සංඛ්‍යාලේඛණ බියුරෝවේ 2004 සහ 2006 වාර්තාවන්ට අනුව එළඹෙන පහළොස් වසරක කාලය ඇතුළත ඊශ්‍රයෙල් මුස්ලිම් ජනගහණය 24-26%කින් වැඩිවනු ඇතැයි දැනටමත් ඇස්තමේන්තු කොට තිබේ. *(The Arab Population in Israel - 2003 by Nurit Yaffe / CBS Statistical Abstract of Israel 2006)* 2009 පෙබරවාරියේදී පවත්වන ලද ජන මත විමසුමකට අනුව ඊශ්‍රායෙලය තුළ ජීවත්වන පලස්තීන වැසියන්ගෙන් 62%ක බහුතරයක් අනාගත නිදහස් පලස්තීන රාජ්‍යයක පුරවැසියන් වනු වෙනුවට ඊශ්‍රායෙලයේම ජීවත්වීමට කැමැත්තක් දක්වයි. *(http://archive.constantcontact.com/fs021/1101712342378/archive/1101922202301.html)* නමුත් මේ කිසිදු කරුණක් විසින් පලස්තීන ජනයා සම්බන්ධයෙන් ඊශ්‍රායෙල් රාජ්‍යයේ වර්ග සංහාරක පිළිවෙත බොරු කරන්නේද?

ගිණිකොණදිග තුර්කියේ නිදහස් කුර්දිස්ථානයක් වෙනුවෙන් 1984 සිට ඇවිළ ගිය යුද්ධයෙන් අවම වශයෙන් 40,000කට වැඩි ජනයා මියගොස් ඇතැයි සැළකේ. සමස්ත තුර්කි ජනගහණයෙන් 17%කට වැඩි පංගුවක් සමන්විත වන්නේ කුර්දි

ජනයාගෙනි. 2007 සංගනන වාර්තා අනුව බලතොත් මෙම සංඛ්‍යාව මිලියන 71කි. මෙයින් අති මහත් බහුතරයක් ජීවත් වන්නේ සාම්ප්‍රදායික කුර්දි ප්‍රදේශයන් යටතට නොගැණෙන වයඹ දිග තුර්කියේ තුර්කි බහුතරයක් සහිත ඉස්තාන්බූල් නගරය කේන්ද්‍ර කොටගෙන ය. 2007 සංගණන වාර්තා අනුව 11,372,613ක් වූ එහි ජනගහණයෙන් මිලියන 1.75ක් ජනයා කුර්දි සම්භවයක් සහිත වේ. *(www.hurriyet.com.tr/english/domestic/11197611.asp)* නමුත් කුර්දි ජන ප්‍රදේශ තුළදීත්, ඉන් පිටතදීත් තුර්කි රජය විසින් කුර්දි ජනයා අරභයා දිගු කාලීනව අනුගමනය කරනු ලබන වර්ග සංහාරක පිළිවෙත මේ කිසිවක් විසින් බොරු කරන්නේද?

### ඉලක්කම් ගැන නොනවතින විවාද

වික්ටර් අයිවන්ට අනුව වන්නියේ සමස්ත කොටි පාලන ප්‍රදේශයන් තුළ ජීවත් වූ සමස්ත දෙමළ ජනගහණයම 200,000කට වැඩි නැත. ඒ සඳහා උපුටා දක්වෙන සංඛ්‍යා ලේඛණ ගොන්නකි. මම ඒ ගැන කිසිත් නොකියමි. නමුත් කොටින්ගේ ආධාරකරුවෙකු බවට කාගෙන්වත් බැණුම් නොඅසන වීරසිංහම් ආනන්දසංගරී ඊට පිළිතුරු සපයයි. මාර්තු 26 වෙනිදා ජනාධිපති රාජපක්ෂ බැහැදුටු දෙමළ නියෝජිතයන් සමග අරලිය ගහ මැදුරෙන් පිටමංව ආ ආනන්දසංගරී අප්‍රේල් මුල් සතියේදී රාජපක්ෂ ජනාධිපතිවරයාට මෙසේ ලියයිඃ ''කිලිනොච්චිය සහ මුලතිවු දිසාපතිවරුන් තම දිස්ත්‍රික්කවල පිළිවෙළින් 1,95,832 දෙනෙකුද, 2,20,311 දෙනෙකුද වශයෙන් 4,16,143 දෙනෙකු 2007 දෙසැම්බර් 31 වෙනිදා වන විට එහි වාසය කළ බව ගණනය කර තිබේ. කොටින්ගේ බල කිරීම මත එහි ජනගහණය දෙගුණයක් ලෙස සඳහන් කර තිබුණේ නම් අඩු තරමින් 2,00,871කු එම දිස්ත්‍රික්කවල වාසය කළ යුතු වේ. වවුනියාව හා මන්නාරම දිස්ත්‍රික්කවල ජනගහණයට අයත් 2,85,674 දෙනෙකු මෙම සංඛ්‍යා ලේඛණවලට ඇතුළත් කර නොමැත. වවුනියාව මන්නාරම් දිස්ත්‍රික්කවලට අයත් 50,000ක් දෙනා අවතැන් වී ඇතැයි ගණනය කළහොත් කොටි පාලන ප්‍රදේශයේ අඩු තරමින් 2,58,000ක් දෙනා ජීවත්ව සිටිය යුතුයි. එම ජනතාවගෙන් 55,000ක් දෙනා රජයේ පාලන ප්‍රදේශවලට පැමිණ ඇති නිසා එම ප්‍රමාණය මුළු ප්‍රමාණයෙන් අඩු කළ පසු කොටි පාලන ප්‍රදේශ තුළ අඩු තරමින් 2,00,000ක් හෝ ජීවත් විය යුතු ය....ඒත් මාගේ ගණනයට අනුව එහි 3,00,000ක් පමණ දෙනා සිටිති.'' *(www.lankaenews.com/Sinhala/news.php?id=8533)* දැන් දිනකට හැට - හැත්තෑව බැගින් විසඳෙන්නේ ඒ 300,000ක් දෙනාගේ ජීවන ඉරණමයි. අයිවන්ගේ චෝදනාවන්ට අනුව 'විෂය පිළිබඳ හරි ගණන් බැලීමක් නොකරන්නේ මා විසින්ද? නැතහොත් අයිවන් විසින්ද?' මේ දක්වා පළ වූ ලිපි සසඳා බලන 'රාවය' පාඨකයින්ට ඒ විනිශ්චයේ වගකීම භාර ය.

### ඔළුව සහ හදවත

අවුරුද්දේ මුල් තුන් මාසය ඇතුළත දී අඩුම ගණනේ 3,000කට වැඩි ජන පිරිසක් ඝාතනය වී 7,000කට වැඩි පිරිසක් තුවාල ලබා ඇති බවට දැන් සාක්ෂි ඕනෑ තරම් ය. අත පය විසුණුව මිය යන, දරු ගැබ් තුළදීම මරු දකින ඒ සියල්ලන් දෙමළුන් ය. සිංහලයින් වූ අපි එය 'වර්ග සංහාරයක්ද - නැතිද' යන්න ගැන සිංහල පත්තර පිටුවල වාද කරමින් සිටිමු. දෙමළුන් 'ත්‍රස්තවාදයෙන්' ගළවාගැනීමට දහ අතේ කල්පනා කරන සිංහල ප්‍රජාතන්ත්‍රවාදයේ උපරිම හතර මායිම එයයි. ජර්මනියේ යුදෙව් සංහාරය ගැන ජර්මන් තානාපති හමු වී කරුණු දැනගන්නැයි මටත්, මහාචාර්ය ජයන්ත සෙනෙවිරත්නටත් අයිවන් ලියා තිබිණ. ඊට කළින් වැල්ලවත්තේ, කොටහේනේ හෝ මට්ටක්කුලියේ දෙමළ මිනිසෙකු හමු වී ලංකාවේ දෙමළ සංහාරය ගැන අසා දැන ගැනීම අයිවන්ට ප්‍රයෝජනවත් විය නොහැකිද?

දෙමළ ජනයාගේ ගැටළුව ගැන දරණ ආස්ථානය, හදවතේ ස්ථාවරය සහ ඔළුවේ ස්ථාවරය වශයෙන් දෙපළු කොට දැක්වීමට වික්ටර් අයිවන් කැමැති ය. ඒ අනුව කුමාර් ඩේවිඩ්, ගාමිණී වියන්ගොඩ හෝ මහින්ද රත්නායක මෙන්ම මාද හදවතින් තර්ක කරන්නෙකු යැයි ඔහු කියන්නට ඉඩක් තිබේ. එය ඇත්තක් නම්, මා දන්නා තරමින් 'දෙමළ අභියෝගය' පොත ලියූ වික්ටර් අයිවන්ටද හදවතක් තිබිණ. දැන් ඔහු ඒ වෙනුවට 'ඔළුවක්' ලබාගෙන තිබේ. ඒ ඔළුවට වඩා මට මගේ හදවත වටියි. මක් නිසාද යත් අඩු වශයෙන් මීට විසි අවුරුද්දකට කලින්ම නලින්ද සිල්වාට, අමරසේකරට හා ඇල්ලේ ගුණවංශට පවා ඒ 'ඔළුව' පහළ වී තිබූ බව මා දන්නා බැවිනි.

**රෝහිත භාෂණ අබේවර්ධන**

*රාවය / 2009 අප්‍රේල් 19*